**කැස්බෑව නගර සභාව - 2020**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

කැස්බෑව නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා

--------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

----------------------------------------------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද නගර සභාව විසින් පුස්තකාල පොත්, පරිගණක, පරිගණක මෘදුකාංග, මංමාවත් හා පාරවල් ,යන්ත්‍ර සහ ලීබඩු හා ඇතැම් මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි 2020 මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේදී මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර ඇති අතර මංමාවත් හා පාරවල් සඳහා වියදම් කළ සභාවේ සත්‍ය වටිනාකම ප්‍රත්‍යාගණන වටිනාකම සේ සළකා ගිණුම්ගත කර ඇත. | සියළුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ආයෝජන ආපසු ගැනීම් වටිනාකම රු.35,288,875 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.69,284,456 ක් ලෙස දක්වා තිබීමෙන් රු.33,995,581 ක් ආයෝජන වලින් ජනිත මුදල් ප්‍රවාහය වැඩියෙන් නිරූපණය වේ. | පිළිගනිමි. නිවැරදි ස්ථාවර තැන්පත්/ (ආයෝජන) ආපසු ගැනීම් - ශුද්ධ අගය රු.38,961,073 ක් බව පරීක්ෂාවේදී තහවුරු විය. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් වටිනාකම රු.618,288,748 ක් වුවද එය රු.602,055,211 කි. එබැවින් ආයෝජන වලින් ජනිත මුදල්, මුදල් හා සමාන දෑ වල වටිනාකම රු.16,233,537 ක් අඩු වී ඇත. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වර්ෂයට අදාළ ක්ෂය රු.128,280,347 ක් ද්විත්ව සටහන් තුළ අන්තර්ගත නමුත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (19) දේපළ, පිරියත හා උපකරණ යටතේ රු.127,943,235 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ක්ෂය වටිනාකම රු.127,943,235 ක් ඇතුළත්ව ඇත. ඒ අනුව ජ'නල් සටහනේ මුද්‍රණ දෝෂය නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස මුදලින් ලද වටිනාකම රු.211,634,900 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.109,002,052 ක් ලෙස දක්වා තිබීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය වලින් ජනිත මුදල් ,මුදල් හා සමාන දෑ වල වටිනාකම රු.102,632,848 ක් වැඩියෙන් දක්වා තිබුණි. | සත්‍ය වශයෙන් මුදලින් ලද ප්‍රාග්ධන වියදම් මුදල රු.211,634,900 කි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි විය යුතු බව පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 222,108,148 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 84,546,284 ක් විය.

### 2.1 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.66,065,078 ක් විය. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | සභාව සතු දිගු කාලීනව බදු දෙන දේපළ 156 කින් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ශේෂය රු.2,909,875 ක් විය. | දේපළ 28 හි හිග ශේෂයෙන් රු.565,960 ක් අයවී ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |